

# කෑගලු දිස්ත්‍රික්කයේ ජෛව විවිධත්වය

දේශගුණික කලාප 03කින් ආවරණය වන ශ්‍රී ලංකා භූමිය වර්ග කිලෝ මීටර 65,610 දක්වා වූ පරාසයක පැතිරී යන පරිසර පද්ධති විවිධත්වයකින් සමන්විත වේ. මෙසේ ඝර්ම කලාපීය දූපතක් ලෙස මුහුදුබඩ සිට රට අභ්‍යන්තරය දක්වා විහි දී යන උෂ්ණත්ව සහ උන්නතාංශ වෙනස විසින් ශ්‍රී ලංකාව ආසියාවේ ම විශ්මයජනක වූත්, අපූර්ව වූත් හරිත පාරාදීසයක් බවට පත් කර ඇත. එනම් එකිනෙකට වෙනස් වූ ජෛව විවිධත්ව පද්ධති රැසකින් සමන්විත වන විවිධ වූ ශාක හා සත්ත්ව ප්‍රජාවන්ගෙන් ශ්‍රී ලංකා භූමිය පෝෂණය වී ඇත. මෙසේ සඳහන් කොට දක්වන ලද ශ්‍රී ලාංකීය ජෛව විවිධත්වය වඩාත් ඔප් නංවනසුළු කෑගල්ල දිස්ත්‍රික්කය, තවමත් සුරක්ෂිතව පවතින ජෛව විවිධත්වය අතින් පොහොසත් ස්වභාව සෞන්දර්යෙන් අනූන ප්‍රදේශයකි.

මේ දිස්ත්‍රික්කයේ පොළොව කළු ගල්, වැලි හා මිනිරන් යන ඛනිජ සම්පත්වලින් පොහොසත් වන අතර ප්‍රධාන වශයෙන් රතු කහ පොඩ්සොලික්, රතුදුඹුරු ලැටසොලික් හා රෙගොසෝල්වලින් යුක්තය. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 26.5 සහ සෙල්සියස් අංශක 28 අතර අගයක පවතින අතර දිවා කාලයේ සාමාන්‍ය ආර්ද්‍රතාව 70%ක් හා 78%ත් අතර පවතින අතර, රාත්‍රී කාලයේ සාමාන්‍ය ආර්ද්‍රතාව 88% හා 94%වේ. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2,493ක් වන කෑගල්ලේ මැයි, ජූනි , ජූලි , අගෝස්තු , සැප්තැම්බර් හා ඔක්තොම්බර් මාසවල අධික වර්ෂාපතනයක් බලාපොරොත්තු විය හැකිය.

මේ දිස්ත්‍රික්කයේ ජෛව විවිධත්වයෙන් පොහොසත් ප්‍රදේශ ලෙස පහතරට තිවර්තන කලාපීය සදාහරිත වැසි වනාන්තර සැලකිය හැකිය. මේ කලාපය තිජ බිම කොටගෙන මීටර් 30ක් හා මීටර්40ක් පමණ උසට වැඩුණු හොර (ඩිප්ටෙරෝකාපසියේ) කුලයට අයත් බොහෝ ශාක වර්ග මේ වනාන්තර පුරා ඉතා සුලභව දක්නට ඇත. මෙහි යටි රෝපණය සකස් වී ඇත්තේ ද මේ වර්ගයාට ම අයත් තොමේරූ ශාක ගහනයෙනි. නමුත් සංසන්දනාත්මකව ඉහළ උන්නතාංශයකින් යුතු වූ යටියන්තොට, දැරණියගල ආදී ප්‍රදේශවල මේ ශාකය මීටර් 35ක් පමණ උසට වැඩේ. මේ කලාපයේ වැසි වනාන්තරවල විශේෂ ලක්ෂණය නම් ශාක කඳන්වල උඩවැඩියා, ලයිකන හා පාසි වැනි බොහෝ අපිශාක දක්නට ලැබීම යි. දිස්ත්‍රික්කය තුළ මුළු වනාන්තර ව්‍යාප්තිය සැලකූ කල එයින් මීටර් 53.7 ක වනාන්තර ආවරණයකට හිමිකම් කියන්නේ දැරණියගල ප්‍රදේශය යි. මේ නිසා දැරණියගල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය අතින් වඩාත් පොහොසත් කලාප අතරට එක් වන්නේ නිතරගයෙනි. එම නිසා දැරණියගල කලාපයට අයත් කිතුල්ගල, දික් ඇල්ලකන්ද , මාගල හා බෙල්ලේහැල ප්‍රදේශවල පැතිරී ඇති වනාන්තර කලාප, රක්ෂිත ප්‍රදේශ බවට පත්විය.

27 පිටුවට..





KEGALLE



26 පිටුවෙන්..

නමුත් දිස්ත්‍රික්කය තුළ මුළු වන ව්‍යාප්තිය ගත් කළ එය අසමකාරව විහි දී ඇත. උදාහරණයක් ලෙස ගත් කල දැරණියගල කොට්ඨාසයේ වන ආවරණය 30%ක් වන නමුදු වරකාපොළ, රුවන්වැල්ල ආදී කොට්ඨාසවල සමස්ත වන ආවරණය 1%ක් තරම් ඉතා කුඩා ප්‍රමාණයක් වේ. දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණය සැලකූ කල එයින් 7%ක් සමස්ත වනාන්තරවල ව්‍යාප්තියට හිමි වේ. ශාක විවිධත්වය එසේ තිබිය දී සත්ත්ව විවිධත්වය ගත් කල සංරක්ෂණයට බඳුන් වන ප්‍රදේශ ප්‍රධාන වශයෙන් 3ක් ඇත. ඒ අතරින් කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හෙක්ටයාර 9ක් පුරා විහිදී ඇති "කුරුලු කැළය" වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කුරුල්ලන්ගේ පරාදීසයකි. ශ්‍රී ලංකා පරිසර ගවේෂණ සංගමය විසින් සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව මේ වන පෙදෙස මේ වන විට දේශීය වශයෙන් තර්ජනයට ලක් වූ සත්ත්ව විශේෂ 51කටත්, ගෝලීය වශයෙන් තර්ජනයට ලක්වූ සත්ත්ව විශේෂ 04කටත් නිජ බිමකි. සපුෂ්ප ශාක 190කින් පමණ සමන්විත වන "කුරුලු කැළය" රක්ෂිතයෙහි සමස්ත සපුෂ්ප ශාක ප්‍රජාව අතුරින් 34ක් ම ඒක දේශික ශාක විශේෂ වේ. මෙහි සමතළ විශේෂ 15ක් පමණ ජීවත් වන අතර, ක්ෂීරපායීන් විශේෂ අතුරින් 09ක් ම දේශීය වශයෙන් තර්ජනයට ලක්වූවෝ වෙති.

රුවන්වැල්ල හා වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මායිම්ව පිහිටි වෙල්හැල්ල-කැටගල්ල(සල්ගල)රක්ෂිතය ද, දැරණියගල කොට්ඨාසයට මායිම්ව පිහිටි ශ්‍රීපාද අභයභූමියට අයත් අක්කර 10,600කින් යුත් විවිධ සත්ත්ව ප්‍රජාවන්ගෙන් අනූන වූ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් සමස්ත ලෝකයට දායාද වූ අපූර්ව වන පෙදෙසකි.

වර්ෂ 1978 දී ගලපිටමඩ ප්‍රදේශයේ දී හඳුනාගත් බත්දුල පෙතියා ද (පුන්ටියස් බන්දුල) ශ්‍රී ලංකාවට අවේණික වන මිරිදිය මත්ස්‍ය විශේෂයක් වන අතර, මොවුන් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් හැර ලෝකයේ වෙනත් කිසිදු ස්ථානයකින් මෙතෙක් වාර්තා නොවීම ද මහත් අභිමානයකි.

අහස් දිය කේන්ද්‍ර කරගනිමින් කෑගලු පුරවරයේ ගොවි ජනතාව විසින් තම පරිසරයේ ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් සිදු කරන කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් මේ වන විට ස්වභාවික ජෛව විවිධත්වයෙහි වෙනසක් වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම ඔවුන්ගේ වගාවන් නිසා පරිසරයට එකතු වන නව ශාක ප්‍රජාවන් හේතුවෙනි. ඒ අතුරින් වගා කරන ලද සමස්ත බිම් ප්‍රමාණයෙන් රබර්, පොල්, වී හා තේ සඳහා පිළිවෙලින් හෙක්ටයාර 89,311, 27,192, 23,516, හා 18,673 වේ. මීට අමතරව මෙහි දී සුළු අපනයන භෝග වගාව සාර්ථක ලෙස ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන වශයෙන් කෝපි, කොකෝවා, ගම්මිරිස්, කරාබු හා සාදික්කා වගාවන් විසින් දිස්ත්‍රික්කය තුළ ශාක ප්‍රජාවන්ට, මිනිසා විසින් නිර්මිත සැලකිය යුතු ජෛව විවිධත්වයක් එක් කරමිනි.

**ඉසුරු දිනුම්**
**ශ්‍රී ලංකා පරිසර ගවේෂණ සංගමය**
**කෑගල්ල**

ශ්‍රී බුද්ධ වර්ෂ 2561 වන රාජ්‍ය වෙසක් උළෙලට

*යකඩ බඩු තීන්ත විදුලි සහ කාර්මික උපකරණ වෙළෙන්දෝ*

**සෙවණ ට්‍රේඩර්ස් ආයතනයේ**
**සුබ පැතුම් !**

**සෙවණ ට්‍රේඩර්ස්, අංක 26,**
**කලුගල්ල මාවත, කෑගල්ල දු. ක. 035-2222479**







ශ්‍රී බුද්ධ වර්ෂ 2561 වන
රාජ්‍ය වෙසක් උළෙලට

**ශ්‍රී නදීකා ජුවලර්ස් වෙතින්**
**සුබ පැතුම් !**







© 2012